**නෙළුව ප්‍රාදේශීය සභාව**

**ගාල්ල දිස්ත්‍රික්කය**

**------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**-----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

---------------------------------

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 30 දින ද, විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2019 ජුනි 14 දින ද සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

--------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට නෙළුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**---------------------------------------------**

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

**----------------------**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු දායක මුදල් රු.7,122,226 ක් වෙනුවෙන් ණයහිමි ප්‍රතිපාදන සලසා නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ දී මිලදී ගත් රු.60,500 ක් වූ ඡායා පිටපත් යන්ත්‍රයක වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි. | වත්කම් ප්‍රාග්ධනිත කළ යුතු වේ. | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු පොලී ආදායම රු.116,420 ක් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iv) | සමාලෝචිත වර්ෂයට අදාළව ලැබුණු උසාවි දඩ රු.70,583 ක් ලැබිය යුතු උසාවි දඩ වශයෙන් ගිණුම් | නිවැරදිව ගිණුම්ගත | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී |

| | | | |
|---|---|---|---|
| | ගතකර තිබුණි. | කළ යුතු වේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (v) | සමාලෝචිත වර්ෂයේ සැපයුම් හා උපකරණ සඳහා වියදම හා ප්‍රවාහන සම්බන්ධතා හා ආවශ්‍යක සේවා වියදම රු.127,000 ක් වැඩියෙන් ගිණුම් ගතකර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (vi) | ඕවර්සියර් ක්ෂේත්‍ර ගබඩා තොගය ලෙස රු.45,665 ක් ගිණුම්වල දක්වා තිබුණ ද, භෞතිකව එවැනි තොගයක් නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ආ) නොසැසඳුනු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.18,415,413 ක් වූ ගිණුම් විෂයයන් 06 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ ලේඛන හා උපලේඛනවල දැක්වෙන ශේෂයන් අතර එකතුව රු.5,083,553 ක වෙනසක් විය. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | කාලයක සිට පවතින අසමානතාවයන් බැවින් ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ii) | ජංගම ගිණුම් 02 කට අදාළ ශේෂ පිරික්සුමේ දැක්වෙන ශේෂයන් සහ මුදල් පොත්වල දැක්වෙන ශේෂයන් අතර රු.67,560 ක වෙනසක් විය. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | කාලයක සිට පවතින අසමානතාවයන් බැවින් ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

(ඇ) **අවිනිශ්චිත ගිණුම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2015 වර්ෂයටත් පෙර සිට ඉදිරියට ගෙනෙමින් පවතින රු.21,176 ක් වූ අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ඒ පිළිබඳව සොයා බලා අවිනිශ්චිත ගිණුම නිරවුල් කළ යුතු වේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| **(i) ලැබිය යුතු ගිණුම්** | | |
| * 2014 වර්ෂයේ සිදු කරන ලද සංවර්ධන ව්‍යාපෘති 07 ක් වෙනුවෙන් පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු රජයේ ආධාර රු.3,572,194 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ලැබිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේ දී අයකර ගනිමි. |
| * සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.16,328,828 ක් වූ ණයගැති ශේෂය තුළ වර්ෂ 05 ට වැඩි එකතුව රු.478,300 ක් වූ එක් හිඟ හිටි ආදායම් ශේෂයක් ද, වර්ෂ 01 ත් 05 ත් අතර වූ එකතුව රු.13,816,285 ක හිඟ හිටි ආදායම් ශේෂ 06 ක් ද ඇතුළත් වී තිබුණ ද, අයකර ගැනීමට නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ලැබිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේ දී අයකර ගනිමි. |
| **(ii) ගෙවිය යුතු ගිණුම්** | | |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වර්ෂ 01 ත් 05 ත් අතර රු.260,222 ක් වූ පොදු සැපයුම් ණයහිමි ශේෂයක් ද, රු.1,266,887 ක් වූ ප්‍රාග්ධන වියදම් ණයහිමි ශේෂයක් ද නිරවුල් නොකර පැවතුණි. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරි වර්ෂයේ දී නිවැරදි කර ගනිමි. |

**(ඊ)** **විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.12,114,561 ක් වූ ගිණුම් විෂයයන් 08 ක් සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**1.4** **අනුකූල නොවීම්**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන ) රීති 218 | සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි වර්ෂයකට වරක් හෝ සමීක්ෂණය කර වාර්තා කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | ඉදිරියේ දී නිසි පරිදි කටයුතු කරමි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 570 හා 571(1)(2) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වර්ෂ 02 ක කාලයක් ඉක්ම වූ වර්ග 02 කට අයත් රු.265,830 ක තැන්පතු ශේෂයක් ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**2** **මූල්‍ය සමාලෝචනය**

**2.1** **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.3,159,098 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.134,952 ක් විය.

## 2.2 මූල්‍ය පාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2006 වර්ෂයේ සිට පැවත එන පොදු ජංගම ගිණුමට අදාළව මුදල් පොතේ ශේෂය හා බැංකු ශේෂය අතර රු.19,648 ක වෙනස නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. | මුදල් පොතේ වෙනස නිවැරදි කළ යුතු වේ. | ඉදිරි වර්ෂයේ නිවැරදි කරමි. |

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 415,500 | 403,450 | 403,450 | 41,223 | 430,000 | 288,080 | 325,854 | 40,005 |
| කුලී | 7,369,300 | 7,414,900 | 7,333,496 | 584,946 | 6,154,800 | 5,835,950 | 6,315,457 | 202,418 |
| බලපත්‍ර ගාස්තු | 184,300 | 259,043 | 259,043 | - | 125,000 | 189,444 | 189,444 | - |
| සේවා සඳහා ගාස්තු | 853,150 | 943,969 | 1,043,969 | - | 2,079,500 | 1,182,199 | 1,182,199 | - |
| | 8,822,250 | 9,021,362 | 9,039,958 | 626,169 | 8,789,300 | 7,495,673 | 8,012,954 | 242,423 |

### 2.3.2 අක්කර බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ අයකර ගත යුතු අක්කර බදු රු.27,920 ක් වුවද, අයකර ගැනීම් රු.7,411 ක් හෙවත් සියයට 26 ක්ව පැවතුණි. | හිඟ අක්කර බදු අප්‍රමාදව අයකර ගත යුතු වේ. | ඉදිරියේ දී අයකර ගැනීමට කටයුතු කරමි. |

**2.3.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු.440,897 ක් හා මුද්දර ගාස්තු වෙනුවෙන් රු.5,375,900 ක් ලැබිය යුතුව තිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කරමි. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතු වේ. | ඉදිරියේ දී වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමට කටයුතු කරමි. |

**(ආ) අත්හැර දැමූ කර්තව්‍යයන්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| නාගරික හා අර්ධ නාගරික ප්‍රදේශ ආශ්‍රිතව හරිත පරිසර කලාප ඇති කිරීම සඳහා ලබාදුන් රු.375,125 ක මුදලින් රු.232,625 ක් යොදවා නෙළුව නගරය අවට සහ දූවිලි ඇල්ල පරිශ්‍රයේ මල් පැල ස්ථාපනය කිරීමට | ව්‍යාපෘතිය කඩිනමින් ඉටුකර ගත යුතු වේ. | ඉදිරියේ දී ව්‍යාපෘතිය ඉටුකර ගනිමි. |

හා පරිසර අලංකරණය කිරීමට ව්‍යාපෘතියක් අනුමත කර තිබූ නමුත්, 2019 පෙබරවාරි 26 දින වන විටත් එය ක්‍රියාත්මක කර නොතිබුණි.

**(ඇ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (i) බල ප්‍රදේශය තුළ තෝරාගත් ප්‍රදේශවල පමණක් කසළ එකතු කර සියලු කසළ සභාවට අයත් ක්‍රීඩාපිටියක් තුළ වලක් කපා වල දැමීම සිදු කරමින් තිබුණි. | කසළ බැහැර කිරීම සඳහා දීර්ඝකාලීන වැඩපිළිවෙලක් සකස් කළ යුතු වේ. | ව්‍යාපෘතියක් සකස් කරමින් පවතියි. |
| (ii) 2017 අප්‍රේල් 20 දිනැති අංක 2015/53 දරන ගැසට් නිවේදනය මඟින් කැළි කසළ ඉවත් කිරීම, එක්රැස් කිරීම, ප්‍රවාහනය අත්‍යවශ්‍ය සේවාවක් බවට පත්කර තිබූ අතර, ඒ සඳහා වෙනම ඒකකයක් පිහිටුවා දිගුකාලීන සැලැස්මක් සකස් කළයුතු බව පෙන්වා දී තිබුණ ද, එවැනි වැඩපිළිවෙලකට සභාව අවතීර්ණ වී නොතිබුණි. | කසළ බැහැර කිරීම සඳහා දීර්ඝකාලීන වැඩපිළිවෙලක් සකස් කළ යුතු වේ. | ව්‍යාපෘතියක් සකස් කරමින් පවතියි. |

**(ඈ) තිරසර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ, තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුලින් සහා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නැංවීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි. | තිරසර සංවර්ධන සඳහා වන දීර්ඝකාලීන සැලසුම් සකස් කර ජනතාවගේ ජීවන තත්ත්වය ඉහල නැංවිය යුතු වේ. | බල ප්‍රදේශයේ ජනතාවගේ ජීවන තත්ත්වය ඉහල නැංවීමට ඉදිරියේ දී සැලැස්මක් සකස් කරමි. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වාර්ෂිකව ටෙන්ඩර් මත බදු දී තිබූ මහජන පොළෙහි සමාලෝචිත වර්ෂයේ විදුලි බිල රු.40,832 ක් සභාවෙන් ගෙවා තිබුණි. | විදුලි බිල ටෙන්ඩර්කරු ගෙවිය යුතු වේ. | පිළිතුරු දී නොමැත. |
| (ආ) | සභාව සතු දෙමහල් වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 21 කින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.584,971ක හිඟ කඩ බදු ශේෂයක් පැවතුණි. මින් කඩ කාමර 04 ක හිඟ බදු අයකර ගැනීම සඳහා නීත්‍යානුකූලව කටයුතු කර තිබූ නමුත්, ඉතිරි කඩ කාමර 17 හි හිඟ සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | හිඟ බදු අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේ දී නීතිමය ක්‍රියාමාර්ග ගෙන හිඟ බදු අයකර ගනිමි. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | **සේවක පුරප්පාඩුව හා අතිරික්තතා**<br>සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති පුරප්පාඩු 10 ක් සම්පූර්ණ කර ගැනීමට හා අතිරික්ත සේවක 05 විධිමත් කර ගැනීමට පියවර ගෙන නොතිබුණි. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමටත්, අතිරික්ත තනතුරු විධිමත් කර ගැනීමටත් කටයුතු කළ යුතු වේ. | ප්‍රජා සංවර්ධන නිලධාරී තනතුර පළාත් පාලන දෙපාර්තමේන්තුව ලබා දී ඇති තනතුරකි. ඉතිරි තනතුරු විධිමත් කර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | **සේවක ණය**<br>සභාවේ සේවය කර මිය ගිය, විශ්‍රාම ගිය, සේවය හැර ගිය සේවකයින් 08 දෙනෙකුගෙන් එකතුව රු.144,020 ක සේවක ණය ශේෂයක් අය නොවී පැවතුණි. | හිඟ ණය ශේෂ අයකර ගත යුතු වේ. | හිඟ ණය ශේෂ ඉදිරියේ දී අයකර ගැනීමට කටයුතු කරමි. |

## 3.4 වත්කම් කළමනාකරණය

## 3.4.1 වත්කම්වලින් ලැබිය යුතු ආදායම් ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතු ජල බවුසරය කුලියට දීමෙන් සමාලෝචිත වර්ෂයේ දී රු.100,000 ක් ලබා ගැනීමට ඇස්තමේන්තු කර තිබුණු නමුත්, සභාවට කිසිදු ආදායමක් ලැබී නොතිබුණි. | කුලියට දීමෙන් ආදායම් ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ. | ජල බවුසරය ප්‍රමාණයෙන් විශාල බැවින් ඇස්තමේන්තුගත ආදායම ලබා ගැනීමට නොහැකි විය. |

## 3.4.2 පවරා නොගත් වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2008 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාලසීමාව තුළ සභාවට ලබා දී තිබුණු රු.2,483,200 ක වටිනාකමින් යුත් වාහන 04 ක් හා වටිනාකම සඳහන් නොවූ වාහන 02 ක් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | වාහනවල අයිතිය පවරා ගත යුතු වේ. | ඉදිරියේ දී අයිතිය පවරා ගැනීමට කටයුතු කරමි. |

## 3.4.3 නිෂ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවට පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් 2008 සහ 2013 වර්ෂවල ලබා දී තිබුණු අත් ට්‍රැක්ටරයක් සහ හොයිස්ටරය 2014 වර්ෂයේ සිට භාවිතයට ගැනීමෙන් තොරව සභා පරිශ්‍රය තුළ ගාල් කර තිබුණි. | අළුත්වැඩියා කළ නොහැකි නම් අපහරණය කළ යුතු වේ. | ඉදිරියේ දී වෙන්දේසි කිරීමට කටයුතු කරමි. |

**3.5 ප්‍රසම්පාදනය**

**3.5.1 ප්‍රසම්පාදන සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ භාණ්ඩ සැපයීම් හා සේවාවන් වෙනුවෙන් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතු වේ. | ඉදිරියේ දී ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කරමි. |

**3.5.2 සැපයීම් හා සේවා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ මිල ගණන් කැඳවීමකින් තොරව රු.343,867 ක් වටිනා ලී බඩු සහ සවිකිරීම් හා රු.534,893 ක් වටිනා ළමා උද්‍යානය උපකරණ මිලදී ගෙන තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව කටයුතු කළයුතු වේ. | ඉදිරියේ දී මිල ගණන් කැඳවීමේ දී ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවමි. |

**4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

**4.1 අයවැය පාලනය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | අරමුණුගත කාර්යයන් සඳහා යොදවා නොගැනීම නිසා වැය විෂයයන් 03 ක රු.97,000 ක් වූ සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. | තාත්වික ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වේ. | වියදම් නිවැරදිව ඇස්තමේන්තු කිරීමට කටයුතු කරමි. |
| (ආ) | වියදම් විෂයයන් 04 ක ඉතිරිවීම්වල එකතුව රු.,5,484,920 ක් හෙවත් සියයට 35 සිට සියයට 50 අතර පරාසයක විය. | තාත්වික ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වේ. | වියදම් ඇස්තමේන්තු කිරීමට කටයුතු කරමි. |

**4.2** **අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 133 හා 134 හි විධිවිධාන හා පළාත් පාලන කොමසාරිස් (දකුණු පළාත) ගේ 2014 පෙබරවාරි 24 දිනැති අංක දපපා/යහ/01/න.ව.ලේ දරන චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ ප්‍රකාරව විගණන සැලැස්මක් සකස් කර, අභ්‍යන්තර විගණනයක් සිදුකළ යුතු වේ. | ඉදිරියේ දී මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කරමි. |
| (ආ) | මුදල් රෙගුලාසි 134 ප්‍රකාරව අභ්‍යන්තර විගණන වැඩසටහන පිළියෙල කිරීමේ දී විගණකාධිපතිගෙන් විමසීම් කර නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන වාර්තා පිළියෙල කර නොතිබුණි. | අභ්‍යන්තර විගණන වාර්තා පිළියෙල කළ යුතු වේ. | ඉදිරියේ දී මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කරමි. |

**4.3** **විගණන හා කළමනාකරණ කමිටු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2009 ජුනි 09 දිනැති අංක DMA/2009(i) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ දී විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | ඉදිරි වර්ෂයේ දී චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කරමි. |